අවසන් දිනය- 2026.02.11

# ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

## පුරප්පාඩු

ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයයටතේ ක්‍රියාත්මක පහත සඳහන් ව්‍යාපෘතිවල **ව්‍යාපෘති අධ්‍යක්ෂ** යන තනතුරු සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ස්ථිර නිලධරයන් ද ඇතුළුව සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම පත්වීම් 2019.03.05 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කළ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019හි සඳහන් විධිවිධානවලට යටත් වනු ඇත.

| **ව්‍යාපෘතියේ නම** | **ව්‍යාපෘති වටිනාකම (ඇ.ඩො. මිලියන)** | **තනතුරු නාමය** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - තුන්වන අදියර (CEP III) | ඇ.ඩො. මිලියන 250ට වැඩි කාණ්ඩය | ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 |
| වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය (PAEHP) | | ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 |

**යථෝක්ත කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019හි ඇමුණුම 01 ප්‍රකාරව ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS 01) තනතුරේ මූලික සුදුසුකම් පහතින් සඳහන් කර ඇත**

**ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS 1) තනතුරසඳහාඅවශ්‍යසුදුසුකම්**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [පහත (I) හෝ (II)හෝ (III)]**

**I.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අනුබද්ධ සාමාජිකත්වය/ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්

සමග

එම සුදුසුකම් ලැබීමෙන් පසුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 16ක පළපුරුද්ද. ඉන් වසර 8ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය.

**II.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අනුබද්ධ සාමාජිකත්වය/ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්

සහ

අදාළක්ෂේත්‍රයේපිළිගත්වෘත්තීයආයතනයකින්ලබාගත්සමායත/වරලත්සාමාජිකත්වයහෝඒහාසමානවෘත්තීයසුදුසුකමක් හෝ අදාළක්ෂේත්‍රයේපශ්චාත්උපාධියක්

සමග

එම සුදුසුකම් ලැබීමෙන් පසුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 14ක පළපුරුද්ද. ඉන් වසර 7ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය.

**III.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

සහ

අදාළක්ෂේත්‍රයේපශ්චාත්උපාධියක්

සමග

අදාළක්ෂේත්‍රයේපිළිගත්වෘත්තීයආයතනයකින්ලබාගත්සමායත/වරලත්සාමාජිකත්වයහෝඒහාසමානවෘත්තීයසුදුසුකමක්

සමග

එම සුදුසුකම් ලැබීමෙන් පසුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද. ඉන් වසර 6ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය.

---

සටහන -

- **අදාළ ක්ෂේත්‍රය යන්නෙන් අදහස් වන්නේ "සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය" වන අතර, පළපුරුද්ද ද අදාළ ක්ෂේත්‍රයේ ම පැවතිය යුතු ය.**

---

**<u>සාමාන්‍ය කොන්දේසි :</u>**

- බඳවා ගැනීම, වැටුප, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි 2019.03.05 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 හි දක්වා ඇති විධිවිධාන ප්‍රකාර වේ.
- තෝරා ගැනීම්, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛමය කොන්දේසි මත පදනම් වේ.
- මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව සියලුම අයදුම්පත් සම්පූර්ණ කර, අදාළ ලේඛනවල සියලුම පිටපත් සමග එවිය යුතු ය.
- එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- තෝරාගනු ලැබුවහොත් අපේක්ෂකයින් දිවයිනේ සහ/හෝ ප්‍රදේශයේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට එකඟ විය යුතු ය.

**01. වයස් සීමාව:**

- රාජ්‍ය,අර්ධ රාජ්‍ය/මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධරයන් සඳහා වයස 60ට අඩු
- අනෙකුත් අයදුම්කරුවන් සඳහා වයස 64ට අඩු

**02 වැටුප:**

- මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 අනුව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

**03. සේවා නියුක්ති කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත ප්‍රථමයෙන් වසරක කාලයක් සඳහා ය. සේවා අවශ්‍යතාව සහ කාර්ය සාධනය මත පදනම්ව දිගුවක් සඳහා සලකා බැලිය හැකි ය.

- අයදුම්කරු දැනටමත් මාර්ග සංවර්ධන අධිකාරියේ ස්ථිර තනතුරක් දරන්නේ නම්, මෙම පත්වීම නිත්‍ය තනතුරේ පත්කිරීම් බලධරයා විසින් නිර්දේශ කරනු ලබන කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි 2.3.3 ඡේදයේ සඳහන් මුදාහැරීමේ පදනම සහ යථා පරිදි මුදාහැරීම මත පදනම් වනු ඇත.

- අයදුම්පත් නිසි පරිදි පුරවා නැති සහ අයදුම් පත සමග නිවැරදි දත්ත සපයා නැති සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි දක්වා ඇති අනෙකුත් අවශ්‍යතා සහ සුදුසුකම් සපුරා නැති අයදුම්කරුවන් පත්වීම් සඳහා සලකා නොබැලේ.

- සේවා දිගු ලබා දීමේ සහ පත්වීම් ප්‍රදානය කිරීමේ තීරණය, චක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි සිදු කෙරේ.

**04. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

මාර්ග සංවර්ධන අධිකාරියේ/රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයක දැනටමත් ස්ථිර තනතුරක් දරන අයදුම්කරුවෙකු තම අයදුම්පත් කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි 2.3.3 ඡේදයට අනුව නිත්‍ය තනතුරෙන් මුදා හැරීමේ සහතිකය සහ මුදාහැරීමේ පදනමේ නිර්දේශය ද සහිතව සිය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය (එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ).

**05. අයදුම්පත යොමු කිරීම**

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහතින් දී ඇති ආකෘතිය අනුව පුරවා අධ්‍යාපන සුදුසුකම්, මූලික උපාධියේ සවිස්තරාත්මක උපාධි සහතිකය (transcript), සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ද සමග 2026.02.11 දිනට හෝ එදිනට පෙර **ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, "මගනැගුම මහමැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අමාත්‍යාංශයේ පාලන අංශයට අතින් ගෙනවිත් භාර දිය හැකි ය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ නිවේදනයේ දැක්වෙන ආකාරයට තනතුරේ සහ ව්‍යාපෘතියේ නම සඳහන් කරන්න.

**06. විශේෂ අවධානය සඳහා**

- **දී ඇති ආකෘතියට අනුකූලව නිසි පරිදි පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **තෝරා ගැනීම සඳහා සලකා බලනුයේ අයදුම්පත සමග සහතිකවල පිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණි.**
- **ඉහත තනතුරු සඳහා 2025.10.10 සහ 2025.10.07 දිනැති පෙර නිවේදනවලට ප්‍රතිචාර වශයෙන් දැනටමත් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් නව අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.**

අයදුම්පත් ආකෘතිය - ඇමුණුම

වැඩිදුර විමසීම් සඳහා - 0112271048

**ලේකම්**
**ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය**